# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2460/10 – 2025 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාදා – 2025.10.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

### පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය නියෝග

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියෙහි 24 වෙනි වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, මේ වනවිට දකුණු පළාත් සභාව විසුරුවා හැර ඇති බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඇ. ව්‍යවස්ථාව අනුව දකුණු පළාත් ආණ්ඩුකාර වන මා වෙත පැවරී ඇති බැවින්, දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ නියෝගවල 03 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කරමින් එම නියෝග මාලාව සංශෝධනය කර මෙයින් නියෝග පනවනු ලැබේ. මෙම නියෝග 2020.07.17 දින සිට බලපැවැත්විය යුතුය.

**මද්දුම කංකානමලාගේ බන්දුල හරිස්චන්ද්‍ර,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2025 ඔක්තෝබර් මස 15 වැනි දින,
පහළ ඩික්සන් පාර, ගාල්ල.
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේදී ය.

03. **(i)**

(අ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටි, යෝජනා ක්‍රමයට බඳවා ගනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තෙකු, තමා දායකයෙකු ලෙස විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සඳහා 2023.12.31 දින හෝ ඊට පෙර දිනකින් මනාපය පළ කළ යුතුය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අපේක්ෂා කරන සේවකයෙකු විසින් මෙහි මින් මතු අධ්‍යක්ෂවරයා වශයෙන් හඳුන්වනු ලබන, යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂවරයා විසින් භාවිතා කිරීමට නියම කර ඇති ඉල්ලුම්පත්‍රය පුරවා, මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට 2025.12.31 දින දක්වා වූ කාල සීමාව තුළ තත්කාලයේ බලය පවරා ඇති නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

**(ii)**

(අ) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ දිනෙන් පසුව හා මෙම නියෝග ක්‍රියාත්මක වන දිනට පෙර ස්ථිර සේවයට බැඳී දින 90 ඉක්ම වූ සේවකයෙකු, 2025.12.31 දින දක්වා වූ කාල සීමාව තුළ දී අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ දිනෙන් පසුව හා මෙම නියෝග ක්‍රියාත්මක වන දිනට පෙර ස්ථිර සේවයට බැඳී දින 90 ක් ඉක්ම නොවූ සේවකයෙකු, අදාළ සමුපකාර සමිතිය විසින් සේවය ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කරන ලද දින සිට දින 90 ක කාලයක් ඇතුළත දී අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම්පත්‍රය පුරවා තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

**(iii)** මෙම නියෝග ක්‍රියාත්මක වූ දින සිට ස්ථිර සේවයට බැඳුනු සේවකයෙකු, අදාළ සමුපකාර සමිතිය විසින් සේවය ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කරන ලද දින සිට දින 90 ක කාලයක් ඇතුළත දී අධ්‍යක්ෂවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

EOG 10 – 0257

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.